## දකුණු පළාතේ, පළාත් සභාවේ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තිය77 (1) (අ) වගන්තිය යටතේ පනවනු ලබන නියෝග.

දකුණු පළාතේ පළාත් සභාවේ, 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 77(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් අමාත්‍ය ශුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මම, එම ප්‍රඥප්තියේ 45වෙනි වගන්තිය සමග කියවෙන 37(අ), (ආ) සහ (ඇ) දරන වගන්තිවල සහ 1992 අංක 02 දරන දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් (සංශෝධිත) ප්‍රඥප්තියේ සඳහන් ලේඛන සහ ලියවිලි පිළිබඳ මුද්දර ගාස්තු ගෙවීම සඳහා පහත සඳහන් නියෝගයන් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ශුස්තිඤ්ඤාවඩු ෂාන් විජයලාල් ද සිල්වා

දකුණු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් අමාත්‍ය

2011 වර්ෂයේ දෙසැම්බර් මස 05 වැනි දින,

ගාල්ල දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

නියෝග

**01.** මෙම නියෝග දකුණු පළාත් සභාවේ, 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 40 වන වගන්තිය යටතේ වූ මුද්දර ගාස්තු ගෙවිය යුතු ආකාරය සම්බන්ධයෙන් වූ නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, එම නියෝග 2012 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියම කළ යුතුය.

**02.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1991 ජනවාරි මස 12 වැනි දින අංක 644/29, 1991 පෙබරවාරි මස 05 වැනි දින අංක 648/5, 1991 ජූලි මස 09 වැනි දින අංක 670/4 සහ 2007 ජනවාරි මස 04 වැනි දින අංක 1478/16 දරන අති විශේෂ ගැසට් නිවේදන මගින් නියම කරන ලද සියළුම වටිනාකම්වලින් යුත් අලවන මුද්දර භාවිත කිරීම අවලංගු කළ යුතුය.

**03.** අදාළ කාර්යය සඳහා අලවන මුද්දර භාවිතා කිරීම වෙනුවට, දකුණු පළාතේ පළාත් සභාවේ 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තියේ 40(2) වගන්තිය ප්‍රකාර බැංකුවට මුදල් ගෙවා ලබා ගත් සහතිකය භාවිතා කළ යුතුය.

**04.** අදාළ කාර්යය සඳහා මුද්දර ගාස්තු වෙනුවෙන් ගෙවිය යුතු මුදල්, ශ්‍රී ලංකාව තුළ ඕනෑම ලංකා බැංකු හෝ මහජන බැංකු ශාඛාවක් වෙත පහත දක්වා ඇති ආකෘතිය අනුව පහත දැක්වෙන ගිණුම් අංක වෙත ගෙවීම් කළ යුතුය.

ලංකා බැංකුව - ගාල්ල කඩ වීදිය, දකුණු පළාත් ආදායම් කොමසාරිස්ගේ මුද්දර ගාස්තු රැස් කිරීමේ ගිණුම් අංක - 402478

මහජන බැංකුව - ගාල්ල කොටුව, දකුණු පළාත් ආදායම් කොමසාරිස්ගේ මුද්දර ගාස්තු රැස් කිරීමේ ගිණුම් අංක - 013-1001-00021541